# සෙලාන් බැංකුවේ රු. බිලියන 4.69 ක හිමිකම් නිකුතුවෙහි සහභාගය සම්පූර්ණ වෙයි

පසුගිය ජූනි 02 වැනිදා නිමා වුණු සෙලාන් බැංකුවේ හිමිකම් නිකුතුව සඳහා වූ සහභාගය මුළුමනින්ම සම්පූර්ණ වී තිබේ. ඡන්ද බලය හිමි සහ ඡන්ද බලය අහිමි යන කාණ්ඩ දෙක යටතේ ඉදිරිපත් කෙරුණු මෙම හිමිකම් නිකුතුව සඳහා, අධි සහභාගයක් දක්නට ලැබීම සුවිශේෂී කාරණයක් විය.

හිමිකම් නිකුතුවේ මූලික අරමුණ වන්නේ ප්‍රථම ස්ථර ප්‍රාග්ධනය වැඩිකර සවිමත් ප්‍රාග්ධන පදනමක් ගොඩනගාගැනීමත්, දිගුකාලීන ණය සේවා සඳහා යොදා ගැනීමට කටයුතු කිරීමත්ය. තව ද බැංකුවේ දිගුකාලීන ණය අංශය සැලකීමේ දී මහා පරිමාණ ආයෝජන ව්‍යාපෘති මෙන්ම කෘෂිකාර්මික, සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපෘති පිළිබඳව ද අවධානය යොමු කෙරේ. මෙම පුළුල් කිරීමේ වැඩසටහනත් සමගව සෙලාන් බැංකුවේ ශාඛා ජාලය තවදුරටත් පුළුල් කිරීමට පියවර ගනු ලැබේ.

සෙලාන් බැංකුවේ සභාපති ඊස්ට්මන් නාරාංගොඩ මහතා මෙහිදී අදහස් දක්වමින් කියා සිටියේ, ''බැංකුව විසින් කරනු ලබන මෙම මුලපිරීම තුළින් නැවත වරක් ශ්‍රී ලංකාවේ මහජනයා තුළ බැංකුව පිළිබඳ ව ඇති විශ්වාසය ගොඩනැංවීමට කටයුතු කෙරෙන බවයි. මෙය බැංකුවේ සාර්ථකත්වය පිළිබඳ ගෞරවනීයභාවයක් මහජනයා තුළ ඇති කිරීමට සමත්වනු බව නොඅමනුමානය'', යන්නයි.

බැංකුවේ ඡන්ද බලයහිමි සාමාන්‍ය කොටස්කරුවන්ට, කොටස් තුනකට එක බැගින් මෙම හිමිකම් නිකුතුව සිදුකෙරුණු අතර ඡන්ද හිමි සාමාන්‍ය කොටස් 43,333,333 ක් එකක් රු. 75/- බැගින් කොටස් හිමියන් වෙත ඉදිරිපත් කෙරුණි.

මීට සමගාමීව ඡන්ද බලය අහිමි සාමාන්‍ය කොටස්කරුවන්ට ද සෑම කොටස් තුනකටම එක බැගින් ඡන්ද බලය රහිත සාමාන්‍ය කොටස් පිරිනැමීමට පියවර ගැනුණු අතර මෙහිදී කොටසක් රු. 35/- බැගින් පිරිනැමෙන අතර ඉදිරිපත් කෙරුණු සම්පූර්ණ කොටස් ප්‍රමාණය 41,186,666 කි.

සෙලාන් බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී කපිල ආරියරත්න මහතා මෙහි දී කියා සිටියේ මෙම හිමිකම් නිකුතුවත් සමඟ ම බැංකුවේ මූලෝපායික මිනුම්දඬුවල නවතම හඳුන්වාදීම් සිදුකිරීමට පියවර ගන්නා බවයි. තව ද උසස් තාක්‍ෂණ ශිල්පක්‍රමවල ආයෝජනයන්, සංවිධානමය ප්‍රතිව්‍යුහගත කිරීම්, ජාත්‍යන්තර පදනම් සැලකිල්ලට ගනිමින් සේවක රැකියා වර්ධනයන් සිදුකිරීම් ආදිය සඳහා ආයෝජනය කිරීම තුළින් බැංකුවේ කාර්ය මණ්ඩලයට ලබා දෙන පුහුණු හා සංවර්ධන අවස්ථා තවදුරටත් වර්ධනය කිරීමට පියවර ගන්නා බව ද හෙතෙම වැඩිදුරටත් කියා සිටියේය.

සෙලාන් බැංකුවේ යෝජිත පුළුල් කිරීමේ වැඩසටහනත් සමගව සෙලාන් බැංකුවේ ශාඛා ජාලය තවදුරටත් ඉහළ නැංවීමට පියවර ගන්නා අතර දැනට පවතින ශාඛා වැඩිදියුණු කිරීමටත් කටයුතු යොදනු ඇත. මෙහිදී උසස් තොරතුරු තාක්‍ෂණ අන්තර්ගතයන් වෙත වැඩි වශයෙන් ආයෝජනය කිරීමට බැංකුව අවධානය යොමු කර ඇත. සිය ගනුදෙනුකරුවන්ට කාර්යක්‍ෂම සේවයක් සැලසීමේ අරමුණින් සහ නවීන තාක්‍ෂණික ව්‍යුහයන් වැඩි වශයෙන් බැංකු කටයුතු සඳහා උපයෝගී කර ගැනීමේ අරමුණු ඇතිව මෙම ක්‍රියාමාර්ගය ගෙන තිබේ.

සෙලාන් බැංකුවේ 2011 පළමු කාර්තුව සඳහා වන මූල්‍ය වාර්තා මෑතක දී එළිදුටු අතර 2011 පළමු කාර්තුවේ දී රු. මිලියන 256.3 ක ලාභයක් වාර්තා කර ඇත. එය පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදය ලාභය වූ රු. මිලියන 185.9 හා සැසඳීමේ 38% ක වර්ධනයකි. එසේම බැංකුවේ බදු පෙර ලාභය 2011 පළමු කාර්තුවේ දී රු. මිලියන 395 ක්වූ අතර පෙර වර්ෂයේ අදාළ කාල පරිච්ඡේදයේ දී එම අගය වූයේ රු. මිලියන 291.7 කි. එනම් 36% ක වර්ධනයකි.

බැංකුව 2010 වසරේ දී රු. බිලියන 1.2 ක ශුද්ධ ලංභයක් වාර්තා කළ අතර පෙර වර්ෂයේ එම අගය දැක්වුණේ රු. මිලියන 543 ක් ලෙසිනි. මේ අනුව ශුද්ධ ලාභයෙහි 126% ක වර්ධනයක් 2010 වසරේ දී වාර්තා තර ඇත. එසේම බැංකුවේ බදු පෙර ලාභය පෙර වසරට සාපේක්ෂව 124% ක වර්ධනයක් පෙන්නුම් කළ අතර එම අගය රු. බිලියන 1.9 ක් විය. බැංකුව ආරම්භයේ පටන් මේ දක්වා කාලය තුළ වාර්තා කළ ඉහළම බදු පෙර ලාභ අගය එය විය.

මේ වන විට ශ්‍රී ලංකාව තුළ තම ස්ථානය මනාව රැක ගනිමින්, සිය උපරිම කාර්ය සාධනය වාර්තා කරමින් මෙරට ප්‍රමුඛ පෙළේ සන්නාම අතරට එක්වීමට සෙලාන් බැංකුව සමත්ව සිටී.